# රුහුණ විශ්වවිද්‍යාලය
## පශ්චාද් උපාධි අධ්‍යයන පිඨය

# අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා අර්ධ ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය

රුහුණු විශ්වවිද්‍යාලයේ අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය මගින් පශ්චාද් උපාධියක් හැදෑරීම සඳහා අර්ධ ශිෂ්‍යත්ව ක්‍රමයක් හඳුන්වා දී තිබෙන අතර ඒ හරහා නව දැනුම, කුසලතා සහ අත්දැකීම් ලබා ගැනීම ඔබට අවස්ථාව ලැබෙන අතර ආයතනයේ වර්ධනයට සහ සංවර්ධනයට දායක වනු ඇත.

පහත සඳහන් රෙගුලාසිවලට යටත්ව අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින්ට ඕනෑම පශ්චාද් උපාධි පාඨමාලාවන් සඳහා පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය විසින් වසරකට අර්ධ ශිෂ්‍යත්ව තුනක් පිරිනමනු ඇත.

- අයදුම්කරු පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය සමඟ ගිවිසුමක් අත්සන් කිරීමෙන් පසු මුළු පාඨමාලා ගාස්තුවෙන් 50% ක් නිදහස් කරනු ලැබේ.
- සියලුම අයදුම්කරුවන් නියමිත කාලයට අදාළ උපාධි පාඨමාලාව සම්පූර්ණ කළ යුතුය. එසේ සම්පූර්ණ කිරීමට අයදුම්කරු අසමත් වුවහොත්, සම්පූර්ණ පාඨමාලා ගාස්තු නැවත අයකරගනු ලැබේ.
- අයදුම්කරුවන්ට අධ්‍යයන නිවාඩු ලබා ගැනීමට අවසර ඇත්තේ විභාග කාලවලදී පමණි.
- මේ සම්බන්ධයෙන් UGC චක්‍රලේඛ, අභ්‍යන්තර චක්‍රලේඛ, සභා තීරණ ආදියෙහි දක්වා ඇති අනෙකුත් කොන්දේසි හා නියමයන් අදාළ අවස්ථාවලදී මේ සඳහා අදාළ වේ.

පශ්චාද් උපාධි පාඨමාලාවක් හැදෑරීමට උනන්දුවක් දක්වන අදාළ සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින්ට මෙහි සදහන් පශ්චාද් උපාධි පාඨමාලාවන් තුන සඳහා මේ දිනවල අයදුම් කළ හැකිය.

- සමාජ විද්‍යාව පිළිබඳ පශ්චාද් උපාධි පාඨමාලාව
- සංවර්ධන සැලසුම් පිළිබඳ පශ්චාද් උපාධි පාඨමාලාව
- ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාද් උපාධි පාඨමාලාව (MBA)

වැඩි විස්තර සඳහා කරුණාකර පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය අමතන්න.

0412239146

fgs@fgs.ruh.ac.lk

http://fgs.ruh.ac.lk